- **ආදරණීය දුවේ පුතේ,**

ඔබ පහත දැක්වෙන කවි සම්පූර්ණ කර ලියන්න.

කවි සම්පූර්ණ කරන්න.
වැස්ස
1. සුළං හමනවා
විදුලි කොටනවා
. . . . . .
. . . . . .
3. නතර නොවී එක දිගට ම
වැස්ස වහිනවා
. . . . . .
. . . . . .
2. වැස්ස වහිනවා
මිදුලෙ වතුර පිරෙනවා
. . . . . .
. . . . . .
4. විදුලි අකුණු අහස පුරා
එළිය ගෙනෙනවා
. . . . . .
. . . . . .
වැහි කළුවර අහස පුරා
අඳුර ගෙනෙනවා

කවදා වත් නැති තරමට
වැස්ස වහිනවා

වැහි බිඳු වැහි බිඳු වැහි බිඳු
කඩා වැටෙනවා

වැවක් වගේ මිදුලෙ වතුර
පිරිලා තියෙනවා



වළාකුලින් වහින වැස්ස...

පද රචනාව :අරිසෙන් අනුබුදු
තනු නිර්මාණය :ඩබ්ලිව් ඩී අමරදේව
ගායනය :ශ්‍යාමලී ලිවේරා

වළාකුලින් වහින වැස්ස
හෝ හෝ ගා වහින වැස්ස
ගංගාවල් හදන වැස්ස
වහිනු වහිනු වහිනු වහිනු වැස්ස

සිරි සිරි පොද වැටෙන වැස්ස
ගස් වැල් පණ ගහන වැස්ස
මිදුලේ අපි තෙමන වැස්ස
වහිනු වහිනු වහිනු වහිනු වැස්ස

මිදුල මුදු කරන වැස්ස
මිදුලේ නැව් යවන වැස්ස
මල්ලිට වැඩ තියෙන වැස්ස
වහිනු වහිනු වහිනු වහිනු වැස්ස

මිදුලෙ රැලෙන් නඟින වැස්ස
හෙන වෙඩි පුපුරවන වැස්ස
පොඩි අප බය කරන වැස්ස
වහිනු වහිනු වහිනු වහිනු වැස්ස

61

"හද ගී පොත" ළමා ගීත එකතුව

- ඉහත ගීතය තාලයට ගායනා කරන්න.
- වැස්ස ගැන කියවෙන තවත් ගීත සොයා ලියන්න.
- ඔබත් වැස්ස ගැන ගීතයක් ලියන්න